# ව්‍යාපාරයන්හි නියලෙන අවධානම් සහිත කණ්ඩායම් පිළිබඳ අභ්‍යන්තර ප්‍රතිපත්තිය

## පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

# හැඳින්වීම

ව්‍යාපාරයන්හි නියැලෙන අවදානමක් සහිත කණ්ඩායම් පිළිබඳ සැලකිල්ලට ගෙන පහත සඳහන් ආකාරයට අවදානමක් සහිත කණ්ඩායම් පිළිබඳ කටයුතු කිරීමේදී පළාත් පාලන ආයතනය සතුව වෙනම අභ්‍යන්තර ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පැනනැගී ඇත.

- අවිධිමත් ව්‍යාපාර
- කාන්තාවන් විසින් පවත්වාගෙන යන ව්‍යාපාර
- ආබාධිතයන් විසින් පවත්වාගෙන යන ව්‍යාපාර
- සමෘද්ධිලාභීන් විසින් පවත්වාගෙන යන ව්‍යාපාර

යහපාලනය කැපවීම හා කාර්යක්ෂම සේවාවක් තුළින් සමෘද්ධිමත් පුරවරයක් යන දැක්ම යථාර්තයක් බවට පත් කරලීම වෙනුවෙන් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ ජන ජීවිතය සුඛිත මුදිත කරලීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ විධි විධාන වලට අනුකූලව හා සම්මත අතුරු ව්‍යවස්ථා වලට අනුව සේවා සැපයීම සඳහා 2023.12.28 වන දින පැවති ප්‍රතිපත්ති හා තීරණ ගැනීමට සහය වීමේ කමිටුව විසින් නිර්දේශ කරගත් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය යටතේ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ බලතල හා කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී ලෙස 2023.12.28 වන දින තීරණ අංක 07 දරණ ලේකම් තීරණය මඟින් අනුමත කරගනිමින් පහත සඳහන් පරිදි ව්‍යාපාරයන්හි නියලෙන අවධානම් සහිත කණ්ඩායම් පිළිබඳ අභ්‍යන්තර ප්‍රතිපත්තිය සකස් කර ඇත.

- අවිධිමත් ව්‍යාපාර පිළිබඳ අභ්‍යන්තර ප්‍රතිපත්තිය
- කාන්තාවන් විසින් පවත්වාගෙන යන ව්‍යාපාර පිළිබඳ අභ්‍යන්තර ප්‍රතිපත්තිය
- ආබාධිතයන් විසින් පවත්වාගෙන යන ව්‍යාපාර පිළිබඳ අභ්‍යන්තර ප්‍රතිපත්තිය
- සමෘද්ධිලාභීන් විසින් පවත්වාගෙන යන ව්‍යාපාර පිළිබඳ අභ්‍යන්තර ප්‍රතිපත්තිය

## ~ දැක්ම ~

*යහපාලනය කැපවීම හාකාර්යක්ෂම සේවාවක් තුළින් සමෘද්ධිමත් පුරවරයක්*

## ~ මෙහෙවර ~

*ප්‍රාදේශීය සභා බල  ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය, මාර්ග, පොදු උපයෝගිතා සේවා සහ සුභසාධන පහසුකම් සලසමින්, ජනතාවගේ සුවපහසුව රැකීමට හා වැඩි දියුණුවට බලපාන සියලු කාරණයන්,විධිමත් කර පාලනය කර පවත්වාගෙන යාම සඳහා එක්සත්ව එක්සිත්ව කටයුතු කිරීම අපගේ මෙහෙවර වන්නේය.*

# සම්මුතිය

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව මඟින් ක්‍රියාත්මක කරනු ලබන අවදානම් සහිත කණ්ඩායම් සඳහා ක්‍රියාත්මක කරන අභ්‍යන්තර ප්‍රතිපත්තිය සඳහා 2023.12.28 දින පැවති ප්‍රතිපත්ති හා තීරණ ගැනීමට සහය වීමේ කමිටුවේ තීරණ අංක 07 මඟින් නිර්දේශ කර ඒ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය යටතේ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් හා බලතල, කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි ලෙස මම තීරණය කරමි.

ආර්.කේ.කපිල ජගත් ගුණතිලක,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,

# පටුන

පිටු අංකය


**01.** අවිධිමත් ව්‍යාපාර යනු 01

**1.1** අවිධිමත් ව්‍යාපාර පිළිබඳ අභ්‍යන්තර ප්‍රතිපත්තිය

**1.2** අවිධිමත් ව්‍යාපාර වර්ගීකර්ණය (හදුනා ගන්නා ක්‍රම)

**1.3** අවිධිමත් ව්‍යාපාර හදුනාගත් පසු ගන්නා ක්‍රියාමාර්ග

**1.4** අවිධිමත් ව්‍යාපාර ස්ථාන ගත කිරීමේ නිර්නායක

**1.5** අවිධිමත් ව්‍යාපාර විසින් සපුරා ලියයුතු පාරසරික හා සෞඛ්‍ය අවශ්‍යතා

**1.6** අවිධිමත් ව්‍යාපාර සදහා පරික්ෂණ හා අධික්ෂණය

**1.7** බල ප්‍රදේශයේ පවතින අවිධිමත් ව්‍යාපාර පිළිබද සමික්ෂණය

**1.8** අවිධිමත් ව්‍යාපාරය සදහා වන අයදුම්පත

**02.**කාන්තාවන් විසින් පවත්වාගෙන යන ව්‍යාපාර පිළිබඳ අභ්‍යන්තර ප්‍රතිපත්තිය

**03.**විශේෂ අවශ්‍යතා සහිත(ආබාධිත)පුද්ගලයින් විසින් පවත්වාගෙන යන ව්‍යාපාර

පිළිබඳ අභ්‍යන්තර ප්‍රතිපත්තිය

**04.**සමෘද්ධිලාභීන්/අඩුආදායම්ලාභින් විසින් පවත්වාගෙන යන

ව්‍යාපාර පිළිබඳ අභ්‍යන්තර ප්‍රතිපත්තිය

**05.**ව්‍යාපරයන් හි නියැලෙන අවධානම් සහිත කණ්ඩායම් පිළිබද අභ්‍යන්තර

ප්‍රතිපත්තියෙහි විනිවිද භාවය සහ මහජන ප්‍රවේශය

**5.1** ප්‍රතිපත්ති ප්‍රදර්ශණය

**5.2** මහජන ප්‍රවේශය

# 01. අවිධිමත් ව්‍යාපාරයක් යනු

පවත්නා නිති හා අතුරු නිතිවලට අනුගත නොවන අයුරින් පවත්වාගෙන යනු ලබන හා බලපත්‍රයක් ලබා දිය නොහැකි ව්‍යාපාර අවිධිමත් ව්‍යාපාර ලෙස හැදින්වේ.

## 1.1 අවිධිමත් ව්‍යාපාර පිළිබද අභ්‍යන්තර ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරිමේ අරමුණු

I. බල ප්‍රදේශය තුළ පවතින අවිධිමත් ව්‍යාපාර විධිමත් ව්‍යාපාර බවට පරිවර්තනය සදහා මූලික හදුනා ගැනිම් සිදු කිරිම.

II. අවිධිමත් ව්‍යාපාර වලින් අනෙකුත් ව්‍යාපාර හා ජනතාව සදහා ඇති වන පිඩා හා හානි හදුනා ගැනිම හා ඒවා අවම කිරිමට අවශ්‍ය පසුබිම සැකසිම.

III. අවිධිමත් ව්‍යාපාර පිළිබද යාවත්කාලින වූ දත්ත පද්ධතියක් පවත්වා ගෙන යාම.

IV. එම ව්‍යාපාර විධිමත් කිරිමට දැනට පවතින නිතිරිති ප්‍රමාණවත් නොවන්නේ නම් ඒ සදහා නව අතුරු ව්‍යවස්ථා හෝ නිතිරිති සකස් කිරිම.

## 1.2 අවිධිමත් ව්‍යාපාර වර්ගිකර්ණය (හදුනා ගන්නා ක්‍රම)

**01.** පිහිටි ස්ථානය අනුව

I. මාර්ග සංවර්ධන අධිකාරිය හෝ වෙනත් අධිකාරියකට අයිති මාර්ග රක්ෂිතයේ පවත්වා ගෙන යන වෙළදාම් කටයුතු

II. අවදානම් සහිත ස්ථාන වල පවත්වා ගෙන යන ලබන වෙළදාම් කටයුතු

උදා -

- නායයාමේ අවදානම් සහිත ස්ථාන
- ප්‍රාදේශිය ලේකම් විසින් ප්‍රකාශිත ඇළ රක්ෂිත වල
- වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත ගංගා රක්ෂිත සිමාවල
- දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත දුම්රිය රක්ෂිත
- පොදු කාණුමත

**02.** වෙළදාම් කටයුතු සිදු කරන ගොඩනැගිල්ලේ ස්වභාවය අනුව

I. අනුමත ගොඩනැගිලි සැලසුමක් රහිත ගොඩනැගිලි

II. තාවකාලිකව සකසන ලද ගොඩනැගිලි

III. ගරා වැටුණු ගොඩනැගිලි

IV. ඉදිකරමින් පවතින ගොඩනැගිලි / අනුකූලතා සහතිකයක් ලබා ගැනිමෙන් තොරව බද්ධවූ ගොඩනැගිලි

V. අයිතිය පිළිබද කරුණකට හැර ගරු අධිකරණයේ නඩු විභාග වෙමින් පවතින ව්‍යාපාරික ස්ථාන

**03.**මූලික නිතිය හෝ ප්‍රාදේශිය සභාව විසින් පනවා ගත් හෝ වැළදගත් අතුරු නිති වලට අනුගත නොවන අයුරින් පවත්වාගෙන යන වෙළදාම් කටයුතු ,

I. පරිසර හානි සිදු වන බවට තහවුරු වන වෙළදාම්

II. සෞඛ්‍ය තත්වයට අදාළ කොන්දේසි සම්පූර්ණ නොකරනලද ව්‍යාපාර

III. පවත්වා ගෙන යනු ලබන නමුත් මේ වන විට පවතින අතුරු ව්‍යාවස්ථා නියාමනය කරමින් බලපත්‍ර නිකුත් කල නොහැකි ව්‍යාපාර

IV. මහජන පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති ව්‍යාපාරයක් නම් ඒම පැමිණිල්ල පරික්ෂණයෙන් තහවුරු විම.

## 1.3 අවිධිමත් ව්‍යාපාර හදුනාගත් පසු ගන්නා ක්‍රියාමාර්ග

I. අවදානම් සහිත ස්ථාන වල පවත්වා ගෙන යන වෙළදාම් සදහා අදාළ නිසි බලධරයාගේ නිර්දේශ ලබා ගෙන ඒම ස්ථාන වලින් ඉවත් වන ලෙස දැනුම් දිම.

II. මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතියකින් තොරව මාර්ග රක්ෂිතය තුළ සිදු කරනු ලබන ව්‍යාපාර සදහා මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබාගෙන ඉදිරිපත් කරන ලෙසට දැන්විම.

III. අනුමත ගොඩනැගිලි සැලසුමක් රහිත ගොඩනැගිලිවල පවත්වාගෙන යන ව්‍යාපාර සදහා එම ගොඩනැගිලි සැලසුම අනුමත කර ගන්නා ලෙස දැනුම් දිම එසේකළ නොහැකි ගොඩනැගිලි සම්බන්ධයෙන් අනවසර ඉදිකිරිම් ඉවත් කිරිම සදහා අධිකරණ ක්‍රියාවලියට යොමු විම.

IV. අතුරු නිති කඩමින් පවත්වාගෙන යන ව්‍යාපාරයක් වන්නේ නම් එම ව්‍යාපාරයට අදාළ කොන්දේසි සම්පුර්න කරන ලෙස දැනුම් දිම. දැනුම් දිමේ ලිපිය මගින් අඩුපාඩු නිවැරදි කර ගන්නා ලෙස දැනුම් දිමෙන් පසු, එම කාලය තුළ අඩුපාඩු නිවැරදි නොකරන්නේ නම් එම ස්ථානයේ ව්‍යාපාරය ඉවත් කිරිමට අවශ්‍ය කටයුතු කිරිම හෝ නිතිමය ක්‍රියාමාර්ග ගැනිම.

## 1.4 අවිධිමත් ව්‍යාපාර ස්ථාන ගත කිරිමේ නිර්නායක

I. අවිධිමත් ව්‍යාපාර මගින් පොදු මාර්ගයන්ට බාධා නොවිය යුතුය.

II. මහජන ප්‍රදේශ හා සංරක්ෂිත ප්‍රදේශ වල අවිධිමත් ව්‍යාපාර පිහිටුවිම තහනම් වේ.

III. පාසල්, රෝහල් හා ආගමික ස්ථාන වැනි සංවේදි ප්‍රදේශ අවට අවිධිමත් ව්‍යාපාර ස්ථාන ගත කිරිම සිමා කෙරේ.

## 1.5 අවිධිමත් ව්‍යාපාර විසින් සපුරා ලියයුතු පාරසරික හා සෞඛ්‍ය අවශ්‍යතා

I. නිසි අපද්‍රව්‍ය කළමණාකරණ පද්ධතියක් පවත්වා ගත යුතුය.

II. ජල මුලාශ්‍ර අසල ක්‍රියාත්මක වන ව්‍යාපාර ජල දුෂණය වැළැක්විමට පියවර ගත යුතුය.

III. ආහාර පිළියෙළ කිරිම හා විකිණිම සම්බන්ධ ව්‍යාපාර සෞඛ්‍ය අමාත්‍යංශයේ මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය.

## 1.6 අවිධිමත් ව්‍යාපාර සදහා පරික්ෂණ හා අධික්ෂණය

I. ප්‍රාදේශීය සභා නිලධාරින් විසින් අවශ්‍යතාවය පරිදි අධික්ෂණ කටයුතු සිදු කරනු ලැබේ.

II. ප්‍රතිපත්ති උල්ලංගණය කිරිම සදහා අනතුරු ඇගවිම දඩ හා ව්‍යාපාර අත්හිටුවිම ඇතුලු දඩුවම් ක්‍රියාත්මක කල හැකිය.

III. මහජන සෞඛ්‍ය පරික්ෂකවරුන් විසින් අවශ්‍යතාය පරිදි සෞඛ්‍ය පරික්ෂා සිදු කරනු ලැබේ.

## 1.7 බල ප්‍රදේශයේ පවතින අවිධිමත් ව්‍යාපාර පිළිබඳ සමික්ෂණය

I. පැල්මඩුල්ල සහා බල ප්‍රදේශය තුළ පවතින අවිධිමත් ව්‍යාපාර සම්බන්ධ විස්තර ආදායම් පරික්ෂක විසින් ලබා ගැනිම.

II. ආදායම් පරික්ෂක විසින් වසරකට දෙවරක් බල ප්‍රදේශය තුල පවතින අවිධිමත් ව්‍යාපාර පිළිබද සමික්ෂණයක් සිදු කර අයදුම්පත්‍රය හරහා එම ව්‍යාපාර වල තොරතුරු සම්පූර්ණ කර ලබා දිම.

III. එසේ ලබා ගන්නා තොරතුරු වලට අදාළව ඉදිරි ක්‍රියාමාර්ග ගැනිම.

## 1.8 අවිධිමත් ව්‍යාපාර සඳහා වන අයදුම්පත

01.ව්‍යාපාර අයිතිකරුගේ නම ..................................................................

02.ව්‍යාපාරික ලිපිනය ................................................................

03.පෞද්ගලික ලිපිනය ..................................................................

04.ව්‍යාපාරයේ ස්වභාවය ...............................................................

05.දුරකථන අංකය ..................................................................

06.අවිධිමත් ලෙස හඳුනා ගත් හේතු ................................................................

07.ප්‍රාදේශිය සභාව දැනුවත් කළේ අත්සන ............................................

දිනය ............................................

නම ............................................

## 02.කාන්තාවන් විසින් පවත්වාගෙන යන ව්‍යාපාර පිළිබඳ අභ්‍යන්තර ප්‍රතිපත්තිය

මීට වසර ගණනාවකට පෙර සමාජය තුළ කාන්තාවකට නිසි තැන ලැබී තිබුණේ නැත. බොහෝ අවස්ථා වලදී කාන්තාව නොසලකා හැරිය තත්වයකට නැතිනම් සමාජයේ දෙවැනි තැන තබා කටයුතු කරන බවත් දක්නට ලැබුණි. එම තත්ත්වය අදවන විට එදා මෙන් නොවුනත් යම් යම් අවස්ථා වලදී අඩු වැඩි වශයෙන් ක්‍රියාත්මක වේ. ඒ අනුව තවමත් සම්පූර්ණයෙන්ම කාන්තාවට සමාජය තුල ලැබිය යුතු ස්ථානය නිසි ලෙස ලබා දී නොමැත. මෙහි ප්‍රතිඵල ලෙස කාන්තා හිංසනය, කාන්තා අයිතිවාසිකම්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අපට කතා කිරිමට සිදු ව ඇත. මේ තත්ත්වය සමනය කර ගනිමින් වඩාත් හොද ප්‍රවේශයක් ලබා දීමේ අරමුණින් පැල්මඩුල්ල ප්‍රාදේශිය සභාව කාන්තාවන් විසින් පවත්වා ගෙන යනු ලබන ව්‍යාපාර සදහා අනුගමනය කරන අභ්‍යන්තර ප්‍රතිපත්තිය පහත පරිදි සකස් කර ඇත.

01. වෙළද පොළ අවස්ථා ලබා දිමේදී කාන්තා ව්‍යාපාරික ප්‍රජාව ප්‍රමුඛ කොට සැලකිම.
02. ප්‍රාදේශිය සභාව මගින් සංවිධානය කරනු ලබන පුහුණු වැඩසටහන් සදහා කාන්තා ව්‍යාපාරික ප්‍රජාව සම්බන්ධ කර ගැනිම.
03. නිෂ්පාදන අලෙවිය සදහා විශේෂ අලෙවි පොළවල් ලබා දිම.
04. ජාත්‍යන්තර කාන්තා දිනය, ජාත්‍යන්තර දියණියන්ගේ දිනය වැනි කාන්තාවන් වෙනුවෙන් වෙන් වු විශේෂිත දින අලලා ඒ සම්බන්ධව සමාජයට පණිවිඩයක් දිය හැකි ආකාරයේ වැඩසටහන් සභාවේ මැදිහත් විම මත ක්‍රියාවට නැංවිම.
05. කාන්තා ව්‍යාපාරික ප්‍රජාව දිරිගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
06. කාන්තාවන් විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරික ස්ථාන වලින්ද මිල ගණන් ලබා ගැනීම සහ මිලදී ගැනීමේදී ප්‍රමුඛතාවය ලබාදීම.
07. මිලදී ගැනීම සඳහා ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වි නොමැති නමුත් තම නිෂ්පාදනයන් සදහා මිල ගණන් ලබා දිමේ අවස්ථාව කාන්තා ව්‍යාපරිකයින්හට ලබා දිය යුතු බව.
08. සතිපොල භූමිය තුල කාන්තා ව්‍යාපාරිකයින්ට තම නිෂ්පාදන අලෙවියට වෙනම ස්ථානයක් වෙන් කර දිම.

## 03.විශේෂ අවශ්‍යතා සහිත(ආබාධිත)පුද්ගලයින් විසින් පවත්වාගෙන යන ව්‍යාපාර පිළිබඳ අභ්‍යන්තර ප්‍රතිපත්තිය

**විශේෂ අවශ්‍යතා සහිත(ආබාධිත) පුද්ගලයින් යනු ශාරීරික, මානසික,සංවේදී හෝ බුද්ධිමය හැකියාවන්හි සීමාවක් ඇති පුද්ගලයන් වෙති. ඔවුන්ගේ දෛනික ජීවිතය, අධ්‍යාපනය, රැකියාව, සංචාරය සහ සමාජ ජීවිතයෙහි සෘජු බලපෑමකට ලක්විය හැක. සමාජය වශයෙන් අපගේ වගකීම වන්නේ ඔවුන්ට සමාන අවස්ථා සහ ආධාර ලබා දී ඔවුන්ගේ ජීවිත වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම හා ඔවුන්ගේ ජීවිත බලගැන්වීමයි.**

**ශ්‍රී ලංකාවේ සමස්ථ ජනගහනයෙන් 8.7% පමණ ආබාධ සහිත පුද්ගලයන් වේ. ආබාධිතභාවයේ ව්‍යාප්තිය පිරිමින්ට වඩා කාන්තාවන් තුළ සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පවතී. විශේෂයෙන්ම දිළිදු, සමාජ, ආර්ථික ස්ථර අතර සහ ග්‍රාමීය ප්‍රදේශ වල ආබාධ සහිත පුද්ගලයන් ප්‍රමාණයෙන් වැඩි වන අතර නිසි පහසුකම් ද ඔවුනට නොලැබේ. එබැවින් ව්‍යාපාර කටයුතු වල නියැලෙන ආබාධ සහිත පුද්ගලයින් ආර්ථික හා සාමාජීය වශයෙන් තෘප්තිමත් හා ඔවුන්ට සමානව සලකන අන්තර්කරණය වූ සමාජයක් බිහිකිරීම උදෙසා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කරන අභ්‍යන්තර ප්‍රතිපත්තිය පහත දැක්වේ.**

01. . වෙළඳ පොළ අවස්ථා ලබා දීමේදී විශේෂ අවශ්‍යතා සහිත ව්‍යාපාරික ප්‍රජාව මූලික කොට සැලකීම
02. සභා බල ප්‍රදේශයේ වෙසෙන විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් විසින් පවත්වාගෙන යන ව්‍යාපාරික ස්ථානයන්හි නිෂ්පාදනයන් සභාවේ අවශ්‍යතා අනුව ප්‍රමුඛතාවය ලබාදී මිලදී ගැනීමට කටයුතු කල යුතු බව.
03. මිලදී ගැනීම සඳහා ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වි නොමැති නමුත් තම නිෂ්පාදනයන් සඳහා මිල ගණන් ලබා දීමේ අවස්ථාව විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් හට ලබා දිය යුතු බව.
04. සභාව විසින් ක්‍රියාවට නංවන ආධාර වැඩසටහන් සහ සහනාධාර සැපයුම් වැනි වැඩසටහන් වලදී ප්‍රමුඛතාවය මෙම පිරිසට ලබා දිය යුතු බව.
05. සභාව සතු පොදු ස්ථානයන්ට බාධාවකින් තොරව පිවිසිය හැකි අයුරින් පිවිසුම් මාර්ගයන් සහ අනෙකුත් පහසුකම් සැපයීම.
    උදා - ආබාධිත ප්‍රවේශය
06. සේවාලාභියෙකු ලෙස අප වෙත පැමිණෙන විශේෂ අවශ්‍යතා සහිත පුරවැසියන්ගේ අවශ්‍යතා කඩිනමින් විමසා බලා ඒ සඳහා අවශ්‍ය පිලියම් යෙදීම.
    උදා- ලිපි කටයුතු වැනි කාරණා සිදු කර දීම.
    කඩිනමින් අදාළ නිලධාරින් හමුවට යොමු කිරීම.
07. විශේෂ අවශ්‍යතා සහිත ව්‍යාපාරික ප්‍රජාවන්ගේ ව්‍යාපාරික ස්ථානයන්ට ආයතනික ක්ෂේත්‍ර නිලධාරින් යවා ව්‍යාපාර බදු,කර්මාන්ත බදු,බලපත්‍ර ගාස්තු අය කිරීම හා ඊට අදාළ අයදුම්පත්‍රයන් පුරවා දීම වැනි ලිපි කටයුතු සිදු කර දීම.
08. නිෂ්පාදන අලෙවිය සඳහා විශේෂ අලෙවි පොළවල් ලබා දීම.
09. ආබාධිත පුද්ගලයන් සඳහා උපකරණ ලබා දෙන අවස්ථාවන්ට හා ප්‍රාදේශීය සභාව විසින් නොමිලේ පවත්වන වෛද්‍ය සායන සඳහා සම්බන්ධ කර ගැනීම.
10. විශේෂ අවශ්‍යතා සහිත ව්‍යාපාරික ප්‍රජාව වෙනුවෙන් දිරි ගැන්වීම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

11. සතිපොල භූමිය තුල විශේෂ අවශ්‍යතා සහිත(ආබාධිත) ව්‍යාපාරිකයින්ට තම නිෂ්පාදන අලෙවියට වෙනම ස්ථානයක් වෙන් කර දීම.

## 04.සමෘද්ධිලාභීන්/අඩුආදායම්ලාභීන් විසින් පවත්වාගෙන යන ව්‍යාපාර පිළිබඳ අභ්‍යන්තර ප්‍රතිපත්තිය

01.සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන දරිද්‍රතාවය පිටුදැකීමේ පුහුණු වැඩසටහන් සඳහා අඩුආදායම්ලාභී ව්‍යාපාරික ප්‍රජාව සම්බන්ධ කර ගැනීම.

02.නිෂ්පාදන අලෙවිය සඳහා විශේෂ අලෙවි පොළවල් ලබා දීම.

03.අඩුආදායම්ලාභි ව්‍යාපාරික ප්‍රජාව විසින් නිපදවනු ලබන නිෂ්පාදන වල තත්ත්වය පරික්ෂා කර බලා අවශ්‍යතාවය අනුව මිල ගණන් ලබා ගැනීමටත් මිලදී ගැනීමේදී ප්‍රමුඛතාවය ලබා දීමටත් කටයුතු කල යුතු බවත්

04.වෙළඳ පොළ අවස්ථා ලබා දීමේදී අඩුආදායම්ලාභී ව්‍යාපාරික ප්‍රජාව ප්‍රමුඛ කොට සැලකීම

05.අඩුආදායම්ලාභී පුද්ගලයන් සඳහා උපකරණ ලබා දෙන අවස්ථාවන්ට හා ප්‍රාදේශීය සභාව විසින් නොමිලේ පවත්වන වෛද්‍ය සායන සඳහා සම්බන්ධ කර ගැනීම.

## 05.ව්‍යාපරයන් හි නියැලෙන අවධානම් සහිත කණ්ඩායම් පිළිබද අභ්‍යන්තර ප්‍රතිපත්තියෙහි විනිවිද භාවය සහ මහජන ප්‍රවේශය

**5.1** ප්‍රතිපත්ති ප්‍රදර්ශණය

- මෙම ප්‍රතිපත්තිය ප්‍රාදේශිය සභා කාර්යාලයේ සහ වෙබ් අඩවියේ ප්‍රදර්ශණය කළ යුතුයි.

**5.2** මහජන ප්‍රවේශය

- පැල්මඩුල්ල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ජනතාව මෙන්ම සභා බල ප්‍රදේශයේ සේවාලාභී සෙසු ජනතාවට ද මහෝපකාරි වන අයුරින් ප්‍රාදේශිය සභා පනත හා අතුරු ව්‍යවස්ථා වලට අනුකූලව සකස් කරන ලද ඉහත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරමින් සේවා සැපයිම සදහා ඔබගේ මනා සහයෝගය අපේක්ෂා කරමු.

  ඉහත සදහන් ප්‍රතිපත්ති වල යම් වෙනසක් සිදු විය යුතු නම් ඒ බව අපව දැනුවත් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු.